# විද්‍යා සන්නිවේදනය එදා, අද සහ හෙට

ආචාර්ය ජයන්ත වත්තවිදානගේ

**විද්‍යා සන්නිවේදනය යනු කුමක්ද?, විද්‍යා සන්නිවේදනය කළ යුත්තේ ඇයිද?, ඒ කුමන දිශාවකටද? යන්න පිළිබඳ වටහා ගැනීමට සහ විද්‍යා සන්නිවේදනය තීව්‍ර කිරීම සඳහා තව තවත් ප්‍රමාද නොවිය යුතුය. ජාතික සංවර්ධනය සහ ඉදිරි ගමන වේගවත් කිරීම සඳහා විද්‍යා සන්නිවේදනයට කළ හැකි මෙහෙවර අපමණය.**

මෙම ලිපිය මගින් විද්‍යාව ජනතාව අතට ගෙන යාම හෙවත් විද්‍යාව ජනප්‍රිය භාවයට පත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත්, ඒ සඳහා භාවිත කෙරෙන විවිධ ක්‍රමවේද පිළිබඳවත් එහි අතීතය, වර්තමානය හා අනාගතය පිළිබඳවත් කරුණු විමසා බැලෙයි.

**විද්‍යාව තේරුම් ගැනීම යන්නෙන් අදහස් කොට ඇත්තේ විද්‍යාත්මක කරුණු, සංකල්ප හා ප්‍රතිපත්ති පිළිබඳවත් ඒවා පෞද්ගලික, සමාජයීය හා ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමයි.**

යම්කිසි විෂයක් හෝ දර්ශනයක් ජනප්‍රිය වන්නේ හෝ ජන අප්‍රිය වන්නේ ඒ පිළිබඳව කිසියම් අවබෝධයක් ජනතාව තුළ හටගත් පසුවය. එබැවින් පළමුව මේ සියවස් පහක් තරම් පැරණි වූ, සත්‍ය සොයාගැනීම පිණිස භාවිත කෙරෙන වඩාත් විශ්වසනීය වූ නවීන විද්‍යාව නම්වූ ක්‍රම වේදය පිළිබඳව පැහැදිලි අවබෝධයක් පොදු ජනතාව තුළ ඇති කළ යුතුය. මේ සඳහා භාවිත කෙරෙන විවිධ ක්‍රමවේද අතර විද්‍යා දින, විද්‍යා ප්‍රදර්ශන, වැඩමුළු, දේශන වැනි සීමිත පිරිසක් සඳහා සංවිධානය කෙරෙන ක්‍රියාකාරකම්වලට අමතරව ජනමාධ්‍ය භාවිතයද බහුලව සිදුවේ. ඊට අමතරව ලෝකයේ බොහෝ නගරවල විවිධ ක්‍රියාකාරකම් සිදු කිරීම මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත හැකි ආකාරයේ විද්‍යා මධ්‍යස්ථාන පිහිටුවා තිබෙයි. මේ අයුරින් ප්‍රජාවේ පොදු සංස්කෘතිය තුළට විද්‍යාවේ සංස්කෘතියත්, විද්‍යාවේ දැනුම් සම්භාරයත් එක් කිරීම සඳහා වූ සියළු ක්‍රියාදාමයන්ගේ එකතුව විද්‍යා සන්නිවේදනය ලෙස හැඳින්වේ.




**තෝමස් හක්ස්ලිගේ, ''සොබාදහමේ මිනිසාට හිමි තැන'' නමැති ග්‍රන්ථය**

මෙම කටයුත්ත සඳහා ජනමාධ්‍ය භාවිතය සැලකීමේදී විද්‍යා ලේඛන කලාව හෙවත් විද්‍යා පුවත්පත් කලාව, හෙවත් විද්‍යා ජන මාධ්‍ය වේදය පුවත්පත් කලාවේ (ජන මාධ්‍යයේ) නව ශාඛාවක් ලෙසට වර්ධනය වූ අතර එමගින් විද්‍යාව පිළිබඳ විවිධ තොරතුරු හා සිදුවීම් මහජනතාව වෙත වාර්තා කිරීම සිදු විය. කෙසේ වෙතත් විද්‍යාත්මක දැනුම සහ සංකල්ප ඉතාම කාර්යක්ෂම ලෙස ජනතාව අතරට ගෙනයාමට නම් එම කාර්යයෙහි යෙදෙන්නන් හට විද්‍යාව පිළිබඳ පමණක් නොව ජනමාධ්‍ය භාවිතය පිළිබඳවත් නිරවුල් අවබෝධයක් තිබිය යුතුය.

ඒ සමගම අප පැහැදිලි කර ගත යුතු තවත් අංගයක් නම් විද්‍යා සන්නිවේදනය සහ විද්‍යා අධ්‍යාපනය යන ක්‍රියාවලීන් එකිනෙකට වෙනස් වන්නේද යන්නයි.

පොදු, සම්මුතියට අනුව නම් විද්‍යා අධ්‍යාපනය යනු විද්‍යාව විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යනය කිරීමට තීරණය කොට ඒ සඳහා කැපවී සිටින පිරිසකට විද්‍යාව ඉගැන්වීමයි. මෙය බොහෝ විට ප්‍රාථමික, ද්විතීයික හා තෘතියික අධ්‍යාපන ආයතනවල විධිමත් ලෙස සිදු කෙරෙන ක්‍රියාවලියකි. මෙලෙස සිදු කෙරෙන විද්‍යා අධ්‍යාපනය මගින් ප්‍රධාන අදහස් දෙකක් ඉටු විය යුතු බව බොහෝ විද්‍යා අධ්‍යාපන විශාරදයන්ගේ අදහසය.

- ප්‍රජාව විසින් විද්‍යාව තේරුම් ගැනීම.
- ප්‍රජාව විද්‍යාව පිළිබඳ වැටහීමක් හෙවත් සම්ප්‍රජානනයක් ඇති කර ගැනීම.

විද්‍යාව තේරුම් ගැනීම යන්නෙන් අදහස් කොට ඇත්තේ විද්‍යාත්මක කරුණු, සංකල්ප හා ප්‍රතිපත්ති පිළිබඳවත් ඒවා පෞද්ගලික, සමාජයීය හා ආර්ථික යහපැවැත්ම කෙරෙහි බලපාන ආකාරයත් පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීමයි. විද්‍යාව වැටහීම හෙවත් සම්ප්‍රජානනය යනු විද්‍යාව සහ තාක්ෂණය කෙරෙහි යොමු වූ ආකල්ප සමූහයක්, හුරුබවක් සහ ළැදි බවකි. මෙහිදී පෙනෙන්නේ විද්‍යාව හා තාක්ෂණය කෙරෙහි යොමු වූ කුසලතා සමූහයක් තුළින් ප්‍රකට වන විශ්වාස හා හැඟීම් පද්ධතියක් හටගන්නා බවයි.

කෙසේ වෙතත් විද්‍යාව හා තාක්ෂණය ප්‍රජාව තුළ ප්‍රචලිත කිරීම ප්‍රජාවේ පුළුල් පරාසයක් එල්ල කොට සිදු කෙරෙන අතර එය අත්‍යාවශ්‍යයෙන්ම, අන්තර් ක්ෂේත්‍ර ප්‍රවේශයක් විය යුතුය. ඒ සඳහා විවිධ ක්ෂේත්‍රවල දැනුම් සම්භාරයක් හා ක්‍රමවේදයක් භාවිත කළ හැකිය. මෙසේ පොදු ජනතාව වෙත විද්‍යාව හා තාක්ෂණය හොඳින් ලංවී හුරු වූ විට එදිනෙදා ජීවිතයේදී ඔවුන් දේශපාලනය වැනි විෂයන් පිළිබඳව ඔවුන්ගේ අදහස් දක්වන අයුරින් විද්‍යාත්මක කරුණු පිළිබඳවද අදහස් දක්වනු ඇත.

එය එසේ විය යුත්තේ එමගින් ජනතාවගේ ජීවන තත්වය ඉහළ දැමීම පිණිසත්, අනාගත ශ්‍රම බලකාය බල ගැන්වීම පිණිසත් ඔවුන් වෙත විද්‍යා සංස්කෘතියක් උරුම කර දීම සඳහාත් එය මහත් පිටිවහලක් වන බැවිනි. එපමණක් නොව පොදුවේ මහජනතාව විද්‍යාව පිළිබඳව ළැදි බවක් හා හුරුවක් තිබීම ඔවුන් පොදු තීරණ ගැනීමේදී සහ පොදු ප්‍රතිපත්ති සම්පාදනයේදී ද අතිශය වැදගත් වේ. ඊට අමතරව විද්‍යා පර්යේෂණයන්හි ප්‍රතිඵල සමාජයේ යහපැවැත්මට භාවිතයට ගැනීමද පහසු කරවන අතර සමාජය තුළ වඩාත් ඉහළ විද්‍යා අවබෝධයක් ඇති කිරීම සඳහාද එය එමගින් අවස්ථාව සලසයි.

**නවීන විද්‍යාව නමැති, සත්‍ය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙම නව ක්‍රමවේදය ආරම්භ වූයේ ගැලීලියෝ ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙනි.**



**මයිකල් පැරඩේ**

ශ්‍රී ලංකාව තුළ වසර දෙදහස් පන්සියයක පමණ අතීතයේ සිට අද දක්වා ශිෂ්ටාචාරය තුළ බොහෝ විද්‍යාත්මක සංකල්පයන්ට සමාන්තර අදහස් හා ඒ සම්බන්ධ කුසලතා ද ඉතා හොඳින් ප්‍රචලිත වී තිබීම සිත් ගන්නා සුලුය.

මිහිඳු මාහිමියන් විසින් දේවානම් පියතිස්ස රජතුමාට දෙන ලදැයි සැලකෙන අවවාදය ප්‍රධාන සන්ධි ස්ථානයක් ලෙස සැලකෙයි. ''මහ රජ, අහසේ සරණ සියොතුන්, වන මෘගයන් හටද ඔබට මෙන්ම මෙම භූමියේ ඕනෑම තැනක වාසය කිරීමේ අයිතියක් ඇති අතර මෙම භූමිය ජනතාවටත්, සියලු ජීවීන්ටත් අයිති වන අතර ඔබ එහි ආරක්ෂකයා පමණි''.

මෙම අවවාදය පිළිගත් දෙවනපෑතිස් රජතුමා විසින් මිහින්තලය පළමු අභය භූමිය ලෙස රාජ අණින් සම්මත කළ බවත් රජු ඇතුළු ජනතාව පරිසරයේ වූ ජීව අජීව සංඝටකයන් අතර වූ අන්තර් සම්බන්ධතාවය සංවේදී ලෙස තේරුම් ගෙන දිවි ගෙවූ බවත් ඉතිහාසය තුළින් ප්‍රකට වන කරුණකි. කෙසේ වෙතත් අද සමස්ත මිහිතලයම මුහුණ දී ඇති ප්‍රබලතම පරිසර ගැටළුවටත් ප්‍රධාන ලෙසම තුඩු දෙන නූතන මිනිසාගේ අධික ශක්ති හා සම්පත් තිරසාර ලෙස භාවිත කිරීමේ සංකල්පය එකල පොදු ජනතාවගේ සංකල්පයක් බවට පත්වී තිබුණු නිසා විය යුතුය. සරල ඇඳුම් පැළඳුම්, සරල ආහාර හා සරල දිවි පැවැත්ම පිළිබඳ පරිසර හිතකාමී සංකල්පයන් සහ සියලු ජීවීන් සමග මිහිතලය බෙදා හදා ගැනීම පිළිබඳ සංකල්පයන් ද, ඒ අනුව හැඩ ගැසුනු සංකල්පයන් ද පොදු ජනතාවගේ සංකල්පයන් හා චර්යාවන් බවට පත්වී තිබීම පරිසර ගැටළු අවම කර ගැනීමට බලපෑ බව ඉතිහාසය පිළිබඳ බොහෝ මූලාශ්‍ර පෙන්වා දෙයි.

දැන් අපි පසළොස් වැනි හා දහසය වැනි සියවස්වල යුරෝපයෙහි ජනිත වූ නවීන විද්‍යාව ජනතාව අතරට ගෙනයාම සඳහා වූ විද්‍යා සන්නිවේදනය ආරම්භ වූ අයුරු දැන් සලකා බලමු. නවීන විද්‍යාව නමැති, සත්‍ය සොයා ගැනීම සඳහා භාවිත කළ හැකි මෙම නව ක්‍රමවේදය ආරම්භ වූයේ ගැලිලියෝ ප්‍රමුඛ විද්වතුන් කිහිප දෙනෙකුගේ දායකත්වයෙනි. එසේ නමුත් නවීන විද්‍යාව තුළින් මතු වූ බොහෝ සත්‍යයන් එකල ජන සමාජයෙහි මුල්බැසගෙන තිබූ අදහස් වලට පටහැනි වූ නිසාත් ඒවා සොයා ගත් මේ නව ක්‍රමවේදය නිසා යුරෝපයේ බොහෝ රටවල රාජ්‍ය තන්ත්‍ර, විවිධ ආගමික සංවිධාන හා සිවිල් සංවිධාන විසින් මේ නව ක්‍රමවේදය හා ඉන් ජනිත වූ අදහස් ප්‍රතික්ෂේප කරන ලදී. මෙනිසා නවීන විද්‍යාව හා පොදු ජනතාව අතර විශාල පරතරයක් හට ගැණිනි. කොටින්ම කියතොත් මේ නවීන විද්‍යාත්මක අදහස් ජනතාව අතර ප්‍රචලිත කිරීම, මරණය හෝ ඊට ආසන්න දඬුවම් ලැබිය හැකි වරදක් විය.

කෙසේ වෙතත් 18 වන සියවසෙහි දී බ්‍රිතාන්‍යයෙහි ''රාජකීය සංගමය'' ප්‍රථම වරට විද්‍යාත්මක තොරතුරු හා නවීන විද්‍යාව පිළිබඳ විධිමත් හා නොවිධිමත් සංවාද සිදුවන ස්ථානයක් බවට පත් විය. එසේ නමුත් මෙම සාකච්ඡාවලට සහභාගි වූයේත්, සහභාගිවිය හැකි වූයේත් සමාජයේ ඉහළ පන්තියට අයත් පුද්ගලයන්ට පමණි. එම සියවසෙහිදීම බ්‍රිතාන්‍යය කේන්ද්‍ර කොටගෙන හටගත් කාර්මික විප්ලවයෙහි ප්‍රතිඵලය ලෙස ඇති වූ කර්මාන්තශාලාවල සේවය කරන, මෙම නව චින්තනයෙහි භාවිත හා සම්බන්ධ වූ නව ශ්‍රම බලකායක් ද, ජනතාව අතුරෙන් හටගැනීම සිදු විය.

ඒ අතර 1799 දී බිහිවන ''බ්‍රිතාන්‍ය රාජකීය ආයතනය'' විද්‍යාව පිළිබඳ සාකච්ඡා, සංවාදයන් සඳහා සමාජයේ සියලු පන්තීන්ට අයත් සාමාජිකයින් හවුල් කර ගත් ප්‍රථම ආයතනය විය. ඒ බව පැහැදිලි වන්නේ රාජකීය ආයතනයෙහි පර්යේෂණාගාර සහ දෙසුම් හල හම්ප්‍රි ඩේවි වැනි මධ්‍යම පන්තිකයන්ටත්, මයිකල් පැරඩේ වැනි පහළ පන්තියේ පුද්ගලයන්ටත්, භාවිත කිරීම සඳහා ඉඩ සලසා දීම මගිනි. එපමණක් නොව එම වසරෙහි රාජකීය ආයතනයෙහි වාර්ෂික නත්තල් දේශනය ද මයිකල් පැරඩේ වෙත පිරිනැමීම මගින් මෙය තව දුරටත් පැහැදිලි වේ. ඉන් පසුව බ්‍රිතාන්‍ය විද්‍යාභිවර්ධන සංගමය ආරම්භ කිරීම, විද්‍යාව ජනප්‍රිය භාවයට පත් කිරීම සඳහා වූ සන්නිවේදනයෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් විය. සංගමයේ එක් අභිමතාර්ථයක් වූයේ විද්‍යාව පිළිබඳ පොදු ජනතාවගේ අවධානය ලබා ගැනීමටත්, විද්‍යාවේ ඉදිරි ගමන වැළැක්වීමට තුඩු දෙන ජන මත ඉවත් කිරීමත්ය. බ්‍රිතාන්‍ය විද්‍යාභිවර්ධන සංගමයේ ආරම්භයත් සමග එයින් උත්තේජනයට පත් වීම නිසා එවකට බ්‍රිතාන්‍යයෙහි යටත් විජිත ලෙසට පැවති රටවල ද විද්‍යාභිවර්ධන සංගම් බිහි විය. මේ අනුව 1848 දී ඇමරිකාවේ ද, 1888 දී ඕස්ට්‍රේලියාවේ ද, 1903 දී දකුණු අප්‍රිකාවේ ද විද්‍යාභිවර්ධන සංගම් පිහිට වූ අතර 1888 දී ඉන්දීය විද්‍යාභිවර්ධන සංගමයත්, ඉන්දීය විද්‍යා කොන්ග්‍රසයත් ආරම්භ විය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ විද්‍යාභිවර්ධන සංගමය පිහිටුවන ලද්දේ 1944 දීය.



**තෝමස් හෙන්රි හස්ක්ලි**

පොදු ජනතාව අතරට විද්‍යාව සන්නිවේදනය කිරීම සැලකීමේ දී බ්‍රිතාන්‍ය ජාතික තෝමස් හෙන්රි හස්ක්ලි (Thomas Henry Huxley) ගෞරවයෙන් සිහිපත් කළ යුතු චරිතයකි. සිංහල භාෂාවෙන් පළවූ මුල් යුගයේ විද්‍යා කෘති අතර මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ''ග්‍රාමීය විද්‍යා ප්‍රවේශය'' සහ ''සත්ව සන්තතිය'' දැක්විය හැකිය. ශ්‍රී ලංකාවෙහි පුවත්පත් මාධ්‍යයෙහි නවීන විද්‍යාව පදනම් කොටගෙන ලියූ ප්‍රථම සිංහල ලිපිය ලෙස සැලකෙන්නේ 1882 ලක්මිණි පහන පත්‍රයේ පළවූ පෝෂණය සම්බන්ධ ලිපියකි. ඉන් පසුව 1833 දී සත්‍යාලංකාරය පත්‍රයෙහි ධූමකේතුවක් පිළිබඳ තොරතුරු පළ විය. 1950 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ සිංහල විද්‍යා සන්නිවේදනයේ පිබිදීමක් ඇති විය. එයට මූලික වූවන් අතර ආචාර්ය ඊ. ඩබ්ඃ අදිකාරම් (එතුමා නවීන විද්‍යා සඟරාවේ සංස්කාරක වරයා ද විය), ආචාර්ය එම්. ඩබ්. කරුණානන්ද, වෛද්‍ය බුද්ධදාස බෝධිනායක ('විද්‍යා' සඟරාවේ සංස්කාරකවරයා ද විය. විද්‍යා සඟරාව පසු කලෙක මහාචාර්ය ටියුලි ද සිල්වා සහ තුසිත මලලසේකර දෙපළ විසින් බොහෝ කලක් සංස්කරණය කරනු ලැබීය). ධනසිරි බෝධිනායක (ලේක්හවුස් ප්‍රකාශනයක්වූ විදුනැණ පුවත්පතේ සංස්කාරක) මහාචාර්ය නන්දදාස කෝදාගොඩ, (එතුමා යුනෙස්කෝ කාලිංග ත්‍යාගයට නම් කළ අතරම ලක්ෂ්මි. එස්. බෙගන් ජාත්‍යන්තර සම්මානයෙන් ද පුද ලැබීය). බන්දුසීලද සිල්වා (ප්‍රථම සිංහල විද්‍යා ශබ්ද කෝෂය) සංස්කාරක මෙන්ම පසු කලෙක තාරකා විද්‍යා ලේඛකයෙකු ලෙස ප්‍රකට වූ අනුර සී. පෙරේරා සමග ජන ප්‍රකාශනයක් වූ ''විදුමිණ'' පුවත්පත සංස්කරණය කළේය. ඔහු පසුව එස්. එම්. බන්දුසීල ලෙස ප්‍රකට වූ අතර ආතර් සී. ක්ලාර්ක් මහතාගේ පොත් විශාල සංඛ්‍යාවක් පරිවර්තනය කිරීමට ද යොමු විය. ''විද්‍යා දින'' නමින් සඟරාවක් ද එකල පළ විය. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය මගින් පළ කළ ''විද්‍යා ව්‍යාප්ති'' සඟරාව ද කලක් විද්‍යාත්මක දැනුම බෙදා හැරීමට දායක විය. 1988 දී උපාලි ප්‍රකාශනයක් ලෙස අනුර සිරිවර්ධන ගේ සංස්කාරකත්වයෙන් ඇරඹූ 'විදුසර' පුවත්පත අද ද පළ වෙයි. සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය විසින් වසර 40ක පමණ කාලයක් ප්‍රකාශයට පත් කරන ''සැපත'' සඟරාව ද වෛද්‍ය විද්‍යාත්මක දැනුම නංවාලීමේ මහඟු කාර්යක් ඉටු කරයි. ජාතික විද්‍යා සභාව විසින් වර්ෂ 1976 දී ආරම්භ කළ 'විදුරාව' සඟරාව ප්‍රකාශනය අද ද, එහි අනුප්‍රාප්තික ජාතික විද්‍යා පදනම විසින් සිදු කරනු ලබයි.



**ආචාර්ය ඊ. ඩබ්ඃ අදිකාරම්**



**වෛද්‍ය බුද්ධදාස බෝධිනායක**



**මහාචාර්ය නන්දදාස කෝදාගොඩ**

ආරම්භයේ සිටම 'නවයුගය' සඟරාව විද්‍යා සන්නිවේදනයේ කැපී පෙනෙන වෙනසක් කරනු ලැබීය. ''ලංකාදීප'' පුවත්පත කලක සිටම සතිපතා විද්‍යා අතිරේකයක් පළ කරයි. ''විද්‍යා විත්ති'' නමින් එය මුල් යුගයේදී ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් විසින් සංස්කරණය කළ අතර පසුව ටික කලක් තුසිත මලලසේකර විසින් සංස්කරණය කරනු ලැබීය. 'විජය', 'මිහිර' වැනි ළමා පුවත්පත්, 'තරුණී', 'සිරිකත', 'නවලිය' වැනි කාන්තා පුවත්පත් සිංහලෙන් විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා බොහෝ සහයක් ලබා දෙමින් එදා මෙන්ම අද ද කටයුතු කරනු පෙනේ. මෑත කාලයේදී 'ලක්බිම' පුවත්පත මගින් නොමිලයේ ලබා දෙන 'සමුදුර' සාර සංග්‍රහය ද විද්‍යා සන්නිවේදනය සඳහා දායක වෙයි. ආචාර්ය උපාලි එම්. සේනානායක, අතුල මංචනායක, වෛද්‍ය විලියම් ද අල්විස්, කේ. ආරියසිංහ, කේ. ආර්. අභයසිංහ, නාලක ගුණවර්ධන, ආචාර්ය ජයන්ත වත්තවිදානගේ, එඩ්වින් ආරියදාස, පර්සි ජයමාන්න, ඩී. අමරසිංහ, ආර්. ඩී. ජේ. අතපත්තු, මහින්ද රණවීර, බෙනඩික්ට් දොඩම්පෙගම ජෝසප් ඩැනිස්ටර් කුරේ වැනි ලේඛකයන් ද

පෙර නම් සඳහන් කළ ලේඛකයන්ට අමතරව සිංහලෙන් විද්‍යාව ජනප්‍රිය කිරීම සඳහා දායක වූ සිංහල ලේඛකයන් අතර පුරෝගාමී වූ අයගෙන් කිහිප දෙනෙකි.

අද ශ්‍රී ලාංකීය ප්‍රජාවෙහි ස්වභාවය විමසා බැලීම අන් බොහෝ සංවර්ධන කටයුතු සැලසුම් කිරීම මෙන්ම විද්‍යා සන්නිවේදනය සඳහා ද වැදගත් වේ. ජනගහනයෙන් 74% නිල කටයුතු සහ අනෙකුත් කටයුතු සඳහා සිංහල භාෂාව භාවිත කරති. 8% විවිධ භාෂා භාවිතයෙහි යෙදෙයි. සතිපතා පුවත්පත් 36ක් පමණ පළවන අතර ව්‍යාප්තිය 1000:94ක් වේ. ප්‍රධාන දිනපතා පුවත්පත් 12ක් පමණ පවතින අතර ඒවායේ ව්‍යාප්තිය දළ වශයෙන් 1000:38ක් පමණ වේ (පුද්ගලයන් 1000කට පුවත්පත් 38). දේශීය රූපවාහිනී මාධ්‍ය ආයතන 21ක් පවතින අතර රූපවාහිනී ග්‍රාහකයන්ගේ ප්‍රතිශතය 1000:78.8ක් පමණ වේ. පසුගිය සංගණනයට අනුව අන්තර්ජාල පහසුකම් 1000:6.3ක ප්‍රතිශතයක් තිබුනද එම ප්‍රතිශතය ශීඝ්‍රයෙන් ඉහළ යන බවක් දක්නට ලැබේ. ඒ සමගම කේබල් රූපවාහිනී ග්‍රාහකයන්ගේ ප්‍රතිශතය ද ශීඝ්‍රයෙන් ඉහළ යයි. කෙසේ වෙතත් කණගාටුවට කරුණ නම් අන්තර්ජාලය හා කේබල් රූපවාහිනී හැරුණු කොට දේශීය රූපවාහිනී නාලිකා, FM නාලිකා සහ පුවත්පත්වල විද්‍යාව සන්නිවේදනය සඳහා දී ඇති ඉඩකඩ ඉතා අල්ප වීමය. මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්ගෙන් මේ පිළිබඳව විමසූ විට ඔවුන් පොදුවේ පවසන කාරණය නම් විද්‍යුත් මාධ්‍ය සඳහා වන, වැඩසටහන් නිෂ්පාදනය හා විකාශනය කිරීම අතිශය මිල අධික කටයුත්තක් බවත් ඒ සඳහා අනුග්‍රහය දක්වන ආයතන විරල බවත්ය. මෙහිදී මතුවන ගැටළු කිහිපයක් වෙයි.

ජනතාවගේ සුබ සිද්ධිය, සංවර්ධනය හා යහපැවැත්ම කෙරෙහි ඔවුන් එදිනෙදා මුහුණ දෙන ගැටළු විද්‍යාත්මක ලෙස විසඳා ගැනීම වැදගත් නම් ජාතික සංවර්ධනය උදෙසා විද්‍යා සන්නිවේදන කාර්යය කෙසේ හෝ කළ යුතුය. නමුත් එසේ කිරීම සඳහා ඇති අවකාශය අඩු වී ඇත්තේ එම තොරතුරු සඳහා වෙළඳ වටිනාකමක්, ඉල්ලුමක් නොමැති බැවිනි. එසේ නම් ගැටළුව විසඳා ගත හැක්කේ කෙසේද?

රාජ්‍ය මාධ්‍ය හා රජය, මෙය ජාතික අවශ්‍යතාවයක් සේ සලකා විද්‍යා සන්නිවේදනයට යටිතල පහසුකම් සලසාදිය යුතුය. එසේත් නැතිනම් විද්‍යා සන්නිවේදනය, එනම් ජනතාව අතරට ගෙන යන විද්‍යාත්මක ක්‍රමවේදය හා තොරතුරු වෙළඳ වටිනාකමක් ඇති ආකර්ෂණශීලී භාණ්ඩයක් බවට පත් කළ යුතුය. මෙය ජනමාධ්‍යවේදීන් වෙත මෙන්ම විද්‍යාඥයන් වෙත පැවරී ඇති අභියෝගයකි.

මෙම අභියෝගයට මුහුණ දීම සඳහා ජනමාධ්‍යවේදීන් මෙන්ම පර්යේෂණවල යෙදී සිටින විද්‍යාඥයන් ද බලවත්කරණය කිරීමෙහිලා ජාතික විද්‍යා පදනමත්, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයත් කර ඇති කාර්යභාරය ප්‍රශංසා කටයුතුය. මෙම ආයතන මගින් විද්‍යා සන්නිවේදනයෙහි කාර්යක්ෂමතාව හා ආකර්ෂණීය ලෙස යෙදෙන මාධ්‍යවේදීන් ජාතික මට්ටමෙන් ඇගයීමට ලක් කෙරෙමින් දිරි දීම සිදු කරයි. පාසල් ප්‍රජාව වෙත විද්‍යාව රැගෙන යාම පිළිබඳ විවිධ වූ ක්‍රියාකාරකම් රැසක් සිදු කෙරෙන අතර, සමහර ක්‍රමවේදයන් ඉතාමත් ආකර්ෂණීය වන බව ඒ පිළිබඳ තොරතුරු සොයාබැලුවහොත් ඔබටත් වැටහෙනු ඇත.

ඒ අතර ජාතික විද්‍යා පදනම මගින් වසර කිහිපයක සිට පර්යේෂණවල යෙදී සිටින විද්‍යාඥයන්ට, පොදු ජනතාව වෙත විද්‍යා සන්නිවේදනය කිරීම පිළිබඳ දැනුම හා කුසලතා ලබා දීමේ වැඩපිළිවෙළක් දියත් කොට තිබෙන අතර එහි ප්‍රතිඵල ලෙස ඊට සහභාගි වූ බොහෝ දෙනකු අතින් බිහිවන නිර්මාණ මෙම වැඩපිළිවෙළෙහි සාර්ථකත්වයට සාක්ෂි සපයයි.

විද්‍යාව ජනප්‍රිය කිරීමෙහි වැදගත්කම විවිධ අංශ ඔස්සේ විහිදෙයි. සෘජු ලෙසට විද්‍යාවේ හා තාක්ෂණයේ දායකත්වය මත දේශයෙහි ආර්ථික වර්ධනයක් ඇති වන බව අප දනිමු. ඒ සඳහා පොදු ජනතාව තුළ පවතින විද්‍යා අවබෝධය අතිශය වැදගත් වේ. අනෙක් අතට ප්‍රජාවේ සෞඛ්‍යය සහ යහ පැවැත්ම කෙරෙහි විද්‍යාව අති ප්‍රබල ලෙස දායක වෙයි. විද්‍යාව හා තාක්ෂණය තුළින් ජාතික සංවර්ධනයක් ලබන්නට නම් විද්‍යාව පොදු සංස්කෘතිය, කලා ශිල්ප හා ජන ජීවිතය හා බද්ධ විය යුතුය.

අවසාන වශයෙන් ජාතියේ දියුණුව කවර දිශාවකට යොමු කළ යුතුද යන්න පිළිබඳ ඉඟියක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි, තම දිවියේ සැලකිය යුතු කාලයක් ගත කළ කීර්තිමත් විද්‍යාඥයෙක් මෙන්ම විද්‍යා සන්නිවේදකයෙක් වූ ආතර් සී. ක්ලාක් මහතාගේ "My Vission for Sri Lanka" ලිපියෙහි පාඨයක් වෙත ඔබේ සිත යොමු කරවමි. ''මිනිසාගේ සෞඛ්‍ය හා සුබ සිද්ධිය සම්බන්ධයෙන් ඉතිරි වී ඇති විශාලතම අභියෝගය වන්නේ ජීවිතයට තව වසර කිහිපයක් එක් කිරීම නොව ජීවත් වන කාලයට නව ජීවයක් එක් කිරීමයි''. ඊළඟ වසර පනහ සඳහා දැක්ම විය යුත්තේ සියළුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීමයි. අපහසුවෙන් වුව ද එවැනි සංවර්ධනයක් අර්ථවත් වන්නේ එය සාමාජීය වශයෙන් හා පාරිසරික වශයෙන් යහපත් වුවහොත් පමණි.


***ආචාර්ය ජයන්ත වත්තවිදානගේ***



***ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ***
***සත්ව විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙකු මෙන්ම***
***ප්‍රවීණ විද්‍යා ලේඛකයෙකි, දේශකයෙකි.***
***විද්‍යුත් මාධ්‍ය නිපුනතාව සහිත***
***සන්නිවේදකයෙකි.***